**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**மகளிர் சிறுவர் விவகார மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**

**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | |
|---|---|
| මගේ අංකය. / எனது இல. / My No | MWCA&SE/01/214 |
| ඔබේ අංකය. / உமது இல. / Your No. | |
| දිනය. / திகதி. / Date | 2024.04. 04 |

චක්‍රලේඛ අංකය -සමාජ සවිබලගැන්වීම/01/2024

**සියලුම දිස්ත්‍රික් ලේකම් / දිසාපති / සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්**

**අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ සහල් බෙදා හැරීම 2024.**

"අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම" මැයෙන් වූ අංක 24-0549-601-038 හා 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් ලබාදෙන ලද 2024.03.19 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය හා අංක 24-0645-601-038-1 හා 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් ලබාදෙන ලද 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2024 වර්ෂය සඳහා මසකට කිලෝග්‍රෑම් 10 බැගින් මාස 02 ක් තුළ අඩු ආදායම්ලාභී පවුල් වෙත නොමිලේ සහල් බෙදා හැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ඇතුළත්ව චක්‍රලේඛයක් ඔබ වෙත නිකුත් කරනු ඇත. එම චක්‍රලේඛයේ උපදෙස්වලට අමතරව සුභසාධක වැඩසටහන්වල සිටින ප්‍රතිලාභී එක් පවුලක් සඳහා මසකට කිලෝග්‍රෑම් 10 ක් බැගින් මාස 02 ක කාලයකට සහල් ලබා දීමට අදාළව පහත උපදෙස් නිකුත් කරනු ලැබේ. ඒ අනුව ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිලාභී සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සකස් කර ගත යුතුය.

## 2.0 ප්‍රතිලාභී නාම ලේඛන

පහත සඳහන් අඩු ආදායම් කාණ්ඩ සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් මෙම සහල් මලු බෙදා දීම සිදු කළ යුතු අතර ඒ සඳහා ග්‍රාම නිලධාරි වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සකස් කරගනු ලබන වාර්තා පදනම් කර ගත යුතුය. මෙහිදී ද්විගණනය නොවන ලෙස ප්‍රතිලාභී නාම ලේඛනය සකස් කර ගත යුතුය.

2.1 අස්වැසුම ප්‍රතිලාභීන් (අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ පළමු වටයේදී තෝරාගෙන ඇති අන්ත දිළිඳු, දිළිඳු, අවධානමට ලක් වූ හා සංක්‍රාන්තික යන කාණ්ඩ හතරට (4) අයත් ප්‍රතිලාභී පවුල්),

2.2 අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ නොලබන 2023 දෙසැම්බර් මස වන විට සමෘද්ධි සහනාධාර ලැබූ පවුල්,

2.3 උක්ත 2.1 හා 2.2 කාණ්ඩයට නොවැටෙන, අමතර මූල්‍ය ආධාර ලබන වැඩිහිටි පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින් හා නිධන්ගත රෝගවලින් පෙලෙන පුද්ගලයින්,


| | කාන්තා, ළමා කටයුතු | සමාජ සවිබලගැන්වීම |
|---|---|---|
| ලේකම්/செயலாளர்Secretary | 011-2186057 | 0112883525 |
| කාර්යාලය/ அலுவலகம்/office: | 011-2186055 | 011-2887349-51 |
| ෆැක්ස්/ பெக்ஸ்/ Fax: | 011-2187249 | 011- 2187007 |
| ඊමේල්/மின் தபால்/Email: | secretary@childwomenmin.gov.lk | wcasesecretary@sltnet.lk |
| වෙබ් අඩවිය/இணையத்தளம்/Website: www.wcasemin.gov.lk | www.childwomenmin.gov.lk | |
| | 05 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල. | 01 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| செத்சிறிபாய,பத்தரமுல்லை | 05 ஆம்மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை | 01ஆம்மாடி, கட்டம் II, |
| Sethsiripaya,Battaramulla | 05th Floor, Stage II, Sethsiripaya,Battaramull | 01st Floor, Stage II, |

2.4 කිසියම් හේතුවක් මත අස්වැසුම වැඩසටහන සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ,සමෘද්ධි හිමිකම තිබූ දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් විසින් සහල් ලබාදිය යුතු යැයි නිර්දේශ කරනු ලබන අඩු ආදායම්ලාභී පවුල්.

2.5 ඉහත 2.1 සිට 2.4 දක්වා කාණ්ඩ වලට අයත් නොවන. එහෙත් මෙම ප්‍රතිලාභය ලැබීමට සුදුසු පවුල් ඇත්නම් සහ එම පවුල් සහල් ලැබීම සඳහා සුදුසුකම්ලාභීන් බවට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම්වරුන් පෞද්ගලිකව සෑහීමකට පත්වන්නේ නම්, එම පවුල් වෙත ද මෙම සහල් ලබා දිය හැකිය.

මෙම නාම ලේඛන සැකසීම ප්‍රාදේශීය ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ සමෘද්ධි සංවර්ධන නිලධාරී. ග්‍රාම නිලධාරි. සමාජ සේවා නිලධාරි හා වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී විසින් සිදු කළ යුතු ය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නියමිත ආකෘතිය මඟින් ලබා දිය යුතු වේ (ඇමුණුම 01).

දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කරන ලද සහල් බෙදාදිය යුතු පවුල් සංඛ්‍යාව අනුමැතිය සඳහා මෙම අමාත්‍යාංශය වෙත ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කල යුතුය. මෙම අමාත්‍යාංශය මඟින් අනුමත කරනු ලබන ලේඛනයෙහි ඇතුළත් පවුල් සංඛ්‍යාව පමණක් සහල් ලැබීම සඳහා සුදුසුකම්ලාභීන් වේ.

**3.0 ප්‍රතිලාභීන් වෙත සහල් මලු බෙදා දීමට සුදුසු ස්ථාන හඳුනා ගැනීම.**

3.1 සහල් මලු ප්‍රවාහන කිරීමේ පහසුව ඇතිවන පරිදි හා ප්‍රතිලාභීන්ට සහල් පහසුවෙන් ලබාගැනීමට හැකිවන පරිදි වසම් මට්ටමින්/ සුදුසු පරිදි වසම් කිහිපයක් ආවරණය වන ලෙස ස්ථානයක් සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරි හා ආර්ථික සංවර්ධන නිලධාරී විසින් හඳුනා ගැනීම සිදු කළ යුතුවේ.

**4.0 සහල් මලු තොග අදාළ ස්ථාන වෙත ප්‍රවාහනය කිරීම හා භාර ගැනීම.**

4.1 ප්‍රතිලාභී නාම ලේඛන අනුව දිස්ත්‍රික්කය තුළ බෙදාහැරීමට ප්‍රමාණවත් සහල් තොග නොමැති නම්, ආසන්නතම දිස්ත්‍රික්කයේ හෝ අතිරික්ත සහල් තොග ඇති දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ සාකච්ඡා කර අවශ්‍ය සහල් තොග ලබාගැනීමට හා වසමේ / වසම් කිහිපයක් ආවරණය වන පරිදි තෝරාගත් ස්ථාන වෙත ප්‍රවාහනය කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සිදු කළ යුතු වේ.

4.2 උක්ත 4.1 පරිදි තෝරාගත් ස්ථානයට ප්‍රවාහනය කරනු ලබන සහල් මලු තොග නිසි ප්‍රතිලාභීන් ප්‍රමාණයට අනුව සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරි හා ආර්ථික සංවර්ධන නිලධාරීන් විසින් පරීක්ෂාකර භාරගැනීම කළ යුතුවේ.

**5.0 ප්‍රතිලාභී පවුල් වෙත සහල් මලු ලබා දීම.**

5.1 සහල් බෙදා දෙනු ලබන දිනය, වේලාව හා ස්ථානය පිළිබඳව සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරි, සමාජ සේවා නිලධාරි, වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරි හා ආර්ථික සංවර්ධන නිලධාරී ඇතුළුව සුදුසු නිලධාරීන් යොදා ගෙන ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිලාභීන් දැනුවත් කළ යුතු වේ.

5.2 යොදා ගත් දිනය තුළ ම ප්‍රතිලාභීන් වෙත සහල් මලු ලබා දීම සිදු කළ යුතු අතර යම් හෙයකින් ඉතිරි වීමක් සිදු වූවහොත් එය ඊට පසු දිනය තුළ අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දීමට හැකි වන පරිදි ආරක්ෂිත ස්ථානයක තාවකාලිකව ගබඩා කර පසු දින බෙදා දිය යුතු වේ.



CamScanner

5.3 සහල් භාර ගැනීම සහ බෙදාදීමට අදාළ වාර්තා සම්පූර්ණ කර ඉතිරි සහල් මිලූ සමඟ ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරී හා ආර්ථික සංවර්ධන නිලධාරීගේ අත්සන සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.

## 6.0 සහල් බෙදා දීමේ ප්‍රවාහන වියදම

තෝරාගත් ස්ථානයට ප්‍රවාහනය කරනු ලැබූ සහල් මලූ බෑම, පැටවීම කිලෝමීටර 25 ට වැඩි දුර ප්‍රමාණයක් ඇති ස්ථාන සඳහා අමතර ප්‍රවාහන වියදම්, වෙනත් දිස්ත්‍රික්කයකින් ප්‍රවාහනය කරන්නේ නම් ඊට අදාල වියදම් හා අනෙකුත් වියදම් ඇත්නම් ඒ පිළිබඳ වාර්තා සකස් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් මඟින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු වේ. එහි දී සහල් ප්‍රවාහන දුර කිලෝමීටර 25 ඉක්මවන අවස්ථාවල දී වැඩිවන දුරට සහල් මෙ.ටො එකක් ප්‍රවාහනය සඳහා රු. 20/= ක් අදාල සැපයුම්කරුට ලබා ගැනීමට හැකියාවක් පවතී.

## 7.0 ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ප්‍රගතිය වාර්තා කිරීම

සමස්ත වැඩසටහන ඔබගේ මූලිකත්වයෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රියාත්මකල යුතු අතර වැඩසටහන ආරම්භයේ සිට සහල් බෙදා දී අවසන් වන තෙක් අඛණ්ඩව අධීක්ෂණය සිදු කළ යුතු වේ. ප්‍රාදේශීය ලේකම් විසින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇමුණුම 03 අනුව සකස් කර දිස්ත්‍රික් ලේකම් මඟින් මා වෙත මාසිකව (අප්‍රේල් සහ මැයි මාස සඳහා වෙන වෙනම) ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

## 8.0 වැඩිදුර තොරතුරු විමසීම්

සහල් බෙදාහැරීමේ දී අවශ්‍යතාවය අනුව පහත නිලධාරීන් විමසිය හැකි ය.

| නිලධාරියාගේ නම | තනතුර | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| එච්.ටී.ආර්.නාලිකා පියසේන | අතිරේක ලේකම්, අමාත්‍යාංශය | 011-2186035<br>071-8009440 | asdevelopmentpost@gmail.com |
| එම්.රාමමූර්ති මහතා | අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රමසම්පාදන, අමාත්‍යාංශය | 011-2877129<br>077-6052457 | ramm847@yahoo.com |
| එච්. කේ. රණවීර මහතා | අධ්‍යක්ෂ, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 071-8050999 | divirelief@gmail.com |
| කේ. ජී. ලැනරෝල් මහතා | අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 011-2187045<br>071-4469228 | nsemss@gmail.com |
| ජයමාලි සී. වික්‍රමාරච්චි මිය | අධ්‍යක්ෂ (වැ.බ), ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය | 011-2863416<br>071-8178867 | mssnspd@gmail.com |

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලදි.

යමුනා පෙරේරා
ලේකම්

පිටපත්

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය -කා.දැ.ගැ.ස
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කා.දැ.ගැ.ස



CamScanner

3. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
5. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
6. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
8. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
9. අධ්‍යක්ෂ ජනරාල්,සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
10. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
11. සභාපති,සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය - කා.දැ.ගැ.ස
12. අධ්‍යක්ෂ, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය - කා.දැ.ගැ.ස
13. අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය - කා.දැ.ගැ.ස
14. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කා.දැ.ගැ.ස

CamScanner

**<u>අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ සහල් බෙදා හැරීම 2024 - ග්‍රාම සේවා වසම් මට්ටමින්</u>**

දිස්ත්‍රික්කය :-

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-

සහල් බෙදාදිය යුතු පවුල් සංඛ්‍යාව :-

| අනු අංකය | ග්‍රාම නිළධාරි වසම | අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සමෘද්ධි සහනාධාර ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අස්වැසුම හෝ සමෘද්ධි සහනාධාර නොලබන | | | 2.4. යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2.5. යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩිහිටි දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආබාධිත දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වකුගඩු දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත වාර්තාව අනුමත කරමි.

............................................................

ප්‍රාදේශීය ලේකම්
අත්සන හා නිල මුද්‍රාව

CamScanner

ඇමුණුම 02

<u>අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ සහල් බෙදා හැරීම 2024 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්</u>

දිස්ත්‍රික්කය :-

සහල් බෙදාදිය යුතු පවුල් සංඛ්‍යාව :-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සමෘද්ධි සහනාධාර ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අස්වැසුම හෝ සමෘද්ධි සහනාධාර නොලබන | | | 2.4. යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2.5. යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩිහිටි දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආබාධිත දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වකුගඩු දීමනා ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත වාර්තාව නිර්දේශ කරමි.

.............................................................

දිස්ත්‍රික් ලේකම්
අත්සන හා නිල මුද්‍රාව

ඉහත වාර්තාව අනුමත කරමි.

.............................................................

ලේකම්
කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

CamScanner

ඇමුණුම 03

<u>අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ සහල් බෙදා හැරීමේ ප්‍රගතිය 2024 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්</u>

............. දිනට

දිස්ත්‍රික්කය :-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගත් මුළු ප්‍රතිලාභීන් ගණන | බෙදාහැරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙත ලැබුණු සහල් මලු ප්‍රමාණය | බෙදාදෙන ලද මුළු සහල් මලු ප්‍රමාණය | ඉතිරි වූ සහල් මලු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

CamScanner